# 2017

## කාර්යසාධන වාර්තාව
## செயலாற்றல் அறிக்கை
## PERFORMANCE REPORT

මහා භාරකාර දෙපාර්තමේන්තුව

**பொது நம்பிக்கைப் பொறுப்பாளர் திணைக்களம்**

Department of Public Trustee

## දැක්ම

පරිත්‍යාගශීලී ස්ථාපකවරුන් විසින් මහා භාරකාරතැන කෙරෙහි තබන ලද විශ්වාසය තහවුරු කිරීම හා අර්ථලාභීන්ගේ අරමුණු ඉටු කිරීම.

## මෙහෙවර

දෙපාර්තමේන්තුව සතු සම්පත් හා හැකියාවන් අනුව ඉහළම සේවයක් සැලසෙන අයුරින් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද හා යොමු කෙරෙන භාර මියගිය පුද්ගලයින්ගේ බූදල් අර්ථලාභීන් ඇතුළුව අදාළ සියළුම පාර්ශවයන්ට තෘප්තිමත්භාවය සැලසෙන අයුරින් පරිපාලනය කිරීම.

## මහා භාරකාරධූරය සහ නෛතික ශක්නුතාවය.

1931 අංක 11 සහ 1938 අංක 59 දරණ ආඥා පනත් මගින් ද, 1973 අංක 44 සහ 1975 අංක 25 දරණ නීති මගින් ද, 1983 අංක 41 සහ 1988 අංක 61 දරණ පනත් මගින් සංශෝධිත 1922 අංක 01 දරණ මහා භාරකාර ආඥා පනත මගින් ශ්‍රී ලංකාව තුළ මහා භාරකාරධූරය, ස්වාධීන අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිතව ස්ථාපිතකොට ඇති අතර, ධූරයේ නාමයෙන් නඩු පැවරීමට සහ පවරනු ලැබීමට නෛතික ශක්නුතාවයක් සහිත වේ.

## නෛතික පසුබිම

1931 අංක 11 සහ 1938 අංක 59 දරණ ආඥා පනත් මගින් ද, 1973 අංක 44 සහ 1975 අංක අංක 25 දරණ නීති මගින් ද, 1983 අංක 41 සහ 1988 අංක 61 දරණ පනත් මගින් සංශෝධිත 1922 අංක 1 දරණ මහා භාරකාර ආඥා පනත යටතේ මහා භාරකාරධූරය ස්වාධින නෛතික පුද්ගලයෙක් ලෙස ස්ථාපිත කර ඇති අතර, අදාළ ආඥා පනත් අනුව ආයතනය සහ ඒ අනුශාංගික කරුණු පාලනය වේ.

භාර සම්බන්ධයෙන් මහා භාරකාර ආඥා පනතට අමතරව 1918 අංක 04, 1934 අංක 1 දරණ ආඥා පනත් මගින් ද 1968 අංක 7 සහ 1971 අංක 30 දරණ පනත් මගින් ද සංශෝධිත 1917 අංක 9 දරණ භාර ආඥා පනත බලපැවැත්වෙන අතර, එකී පනත නිහඬවන්නා වූ යම් අවස්ථාවක දී ඉංග්‍රීසි නීතියේ ඇති සාධාරණත්ව මූලධර්මය(Law of Equity) අදාළ වේ.

## මහා භාරකාරතැනගේ බලතල සහ කාර්යභාරය.

මහා භාරකාර ආඥාපනත, සිවිල් නඩු විධාන සංග්‍රහය, අධිකරණ සංවිධාන පනත සහ වෙනත් ලිඛිත නීති මත පහත කාර්යභාරයන් මහා භාරකාරතැන වෙත පැවරී ඇත.

- සාමාන්‍ය භාරකරුවකුලෙස කටයුතු කිරීම.
- රැකවරණ භාරකරුවකු හෝ ආරක්ෂක භාරකරුවකු ලෙස කටයුතු කිරීම.
- දේපළ රැස්කිරීමේ නියෝග යටතේ දේපළ රැස්කරන්නෙකු ලෙස කටයුතු කිරීම.
- බාලවයස්කරුවකු ගේ දේපළ භාරකරු හෝ සහය මිත්‍රයා (ආරක්ෂක කළමනාකරුවකු) ලෙස කටයුතු කිරීම (දිසා අධිකරණය මගින් පවරන ලද අවස්ථාවක).

- සිහිවිකල් පුද්ගලයකු ගේ දේපළ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම (දිසා අධිකරණය මගින් පවරන ලද අවස්ථාවක).
- නිශ්චල දේපළ ගිවිසුම්ගත කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම. (ආරක්ෂක භාරකරුවකු ලෙස පෙනී සිටින අවස්ථාවල දී එම භාරයන්හි පත්කර ඇති "භාරකාර මණ්ඩලය" මගින් කලින් කලට ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට පමණක් ආරක්ෂක භාරකරු බැඳී සිටී).
- විදේශගත වූ ශ්‍රී ලාංකිකයකු ගේ ඇටර්නි බලකරු ලෙස ඔවුන්ට අයවිය යුතු මුදල් ලබාදීම හෝ ගෙවීම සඳහා කටයුතු කිරීම.
- සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ ප්‍රතිපාදන යටතේ ගරු අධිකරණය මගින් දේපළ සම්බන්ධව සහ අනෙකුත් කරුණු සම්බන්ධව කටයුතු කිරීම.
- ගරු අධිකරණය මගින් පවරන අවස්ථාවල දී අන්තිම කැමති පත්‍රයක් රහිත පුද්ගලයකු ගේ අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස කටයුතු කිරීම.
- වරදකට සිරගතවුවකු ගේ දේපළ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම.
- ඕනෑම පුද්ගලයෙකු ගේ අන්තිම කැමති පත්‍රයක් සුරක්ෂිතව තැන්පත් කර තබාගන්නකු ලෙස කටයුතු කිරීම.
- විහාරස්ථ දේපළෙහි භාරකරු වශයෙන් කටයුතු කිරීම.

## වෙනත් ක්ෂේත්‍ර කෙරෙහි මහා භාරකාරතැනගේ මැදිහත්වීම.

මහා භාරකාර ආඥා පනතට පසුව කරන ලද සංශෝධනයන් අනුව සහ වෙනත් ලිඛිත නීති අනුව මහා භාරකාරතැන වෙත පහත කාර්යයන්ද පැවරී ඇත.

- 1988 අංක 61 දරණ පනත මගින් සංශෝධිත මහා භාරකාර ආඥා පනතේ 10 (අ) වගන්තියට ප්‍රකාරව සේවා නියුක්තිය සඳහා විදේශගත වන්නන්, විදේශයක දී මිය ගියහොත් ඔවුන් වෙනුවෙන් ලැබෙන වන්දි මුදල් යැපෙන්නන් සහ/හෝ නීත්‍යානුකූල උරුමකරුවන් අතර බෙදා දීම සහ සේවා නියුක්තිය සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරයන ශ්‍රී ලාංකික පුරවැසියන් සේවා නියුක්තියෙහි යෙදී සිටියදී මරණයට පත් වූ අවස්ථාවක යම් වන්දි මුදලක් ගෙවනු ලැබිය යුතු තැනැත්තන්ගේ නම් මහා භාරකාරවරයා වෙත ලියාපදිංචි කරවා ගැනීම.
- 1944 අංක 28 දරණ විහාර වන්දි ආඥා පනත ක්‍රියාත්මක කිරීම.
- 1981 අංක 42 දරණ පනතින් සංශෝධිත 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනත යටතේ පැවරී ඇති කාර්යයන් ඉටුකිරීම.
- 1973 අංක 28 දරණ විශේෂ විධිවිධාන පනත යටතේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමෙහි කොටස්වල භාරකාරත්වය රජය වෙනුවෙන් දැරීම.

## මහාභාරකාර දෙපාර්තමේන්තුවෙන් සැලසෙන සේවාවන්.

මෙම දෙපාර්තමේන්තුවෙහි පිහිටුවා ඇති භාරවල අරමුණු අනුව/අන්තිම කැමතිපත්‍රවල ඇති අරමුණු අනුව/අධිකරණ නියෝග මත පහත විෂයයන්හි කටයුතු කරමින් ජනතාවට සේවය සපයනු ලබයි.

- අධ්‍යාපනය හදාරන මූල්‍යමය අතින් ඉතාමත් දුෂ්කරතා ඇති දරුවන් දිරිමත් කිරීම සඳහා ශිෂ්‍යත්ව ලබාදීම.
- අසරණ සහ හදිසි ප්‍රතිකාර අවශ්‍ය රෝගීන්ට වෛද්‍ය ප්‍රතිකර ලබා ගැනීම සඳහා වෛාධාර ලබාදීම.
- ආගමික සිද්ධස්ථාන නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති භාරවල අරමුණු අනුව මූල්‍යාධාර සැපයීම.
- පුණ්‍යාධාර කටයුතු.
- විවිධ හේතුන් නිසා ජීවත්වීමට අපහසු අසරණ පුද්ගලයන්ට සහ එවැනි පුද්ගලයන් සිටින ආයතනවලට ආධාර කිරීම.
- භාර/ බූදල් දේපල කළමණාකරනය කිරීම.
- විහාර දේවාලගම් පනත යටතේ රජයට පවරාගන්නා ලද නිශ්චල දේපළ සඳහා හිමිවන වන්දි මුදල්, බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා ගේ නිර්දේශ මත බෙදාහැරීම.
- සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමෙහිකොටස් වල භාරකාරත්වය රජය වෙනුවෙන් දරමින් එම සමාගමෙහි කටයුතු මෙහෙය වීම හා අධීක්ෂණය.
- විදේශ වන්දි ලෙස ලැබෙන මුදල් යැපෙන්නන් හෝ නීත්‍යානුකූල උරුමකරුවන් අතර බෙදා දීම.
- රාජ්‍ය ආයතනයක් වශයෙන් උපයන ආදායමින් ප්‍රතිශතයක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම.

## මහා භාරකාර දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන භාර සහ බූදල් සංඛ්‍යාව.

පසු ගිය වසර පහක කාලය තුළ මහා භාරකාර දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන භාර සහ බූදල් සංඛ්‍යාව පහත පරිදී වේ.

| වර්ෂය | භාර සංඛ්‍යාව | බූදල් සංඛ්‍යාව |
|---|---|---|
| 2014 | 1034 | 134 |
| 2015 | 1044 | 137 |
| 2016 | 1067 | 140 |
| 2017 | 1081 | 141 |

**<u>මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර ඇති මුදල් ප්‍රමාණය.</u>**

මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති සහ පිහිටුවා ඇති භාර හා බූදල්වලට අදාලව මහා භාරකාර ආඥාපනත යටතේ අය කරනු ලබන මූලධන, ආයෝජන, ආදායම් ගාස්තු හා වෙනත් ගාස්තු පහත පරිදි මහා භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත.

| වර්ෂය | මුදල (රු.) |
|---|---|
| 2014 | 6 ,675,487.77 |
| 2015 | 10,188,334.08 |
| 2016 | 14,986,797.37 |
| 2017 | 11,209,507.45 |

**<u>රජයේ ප්‍රතිපාදන වල ප්‍රගතිය</u>**

| විෂය අංකය | විෂයය විස්තරය | මුළු ප්‍රතිපාදන | 2017.12.31 දක්වා මුළු වියදම |
|---|---|---|---|
| 1001 | වැටුප් හා වේතන | 19,662,000.00 | 19,478,675.00 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 450,000.00 | 404,591.00 |
| 1003 | වෙනත් දීමනා | 12,167,000.00 | 12,093,792.00 |
| 1101 | දේශීය | 270,000.00 | 269,229.00 |
| 1102 | විදේශීය | - | - |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 1,054,590.00 | 1,053,001.00 |
| 1202 | ඉන්ධන | 1,100,000.00 | 1,099,095.00 |
| 1203 | ආහාරපාන හා නිළ ඇඳුම් | 40,000.00 | 39,990.00 |
| 1301 | වාහන | 1,264,875.00 | 1,256,433.00 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 520,000.00 | 465,471.00 |
| 1401 | ප්‍රවාහන | 1,240,000.00 | 1,191,013.00 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 1,110,000.00 | 1,088,878.00 |
| 1403 | විදුලිය හා ජලය | 671,030.00 | 671,028.00 |
| 1404 | බදු කුලී හා පළාත් පාලන ආයතන බදු | 7,200,000.00 | 7,200,000.00 |
| 1409 | වෙනත් | 2,360,000.00 | 2,355,027 |
| 1506 | දේපල ණය පොලී | 365,180.00 | 365,180.00 |
| **පුනරාවර්තන එකතුව** | | **49,474,675.00** | **49,031,404.00** |
| **මූලධන වියදම්** | | | |
| 2001 | ගොඩනැඟිලි සහ ඉදිකිරීම් | 700,000.00 | 699,886.00 |
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 300,000.00 | 294,010.00 |
| 2003 | වාහන | 400,000.00 | 400,000.00 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 322,200.00 | 322,143.00 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,361,125.00 | 1,360,500.00 |
| 2401 | පුහුණු කිරීම් සහ හැකියා වර්ධනය | 94,000.00 | 94,000.00 |
| **මූලධන එකතුව** | | **3,177,325.00** | **3,170,539.00** |
| **මුළු එකතුව** | | **52,652,000.00** | **52,201,943.00** |

## අත්තිකාරම් ගිණුම් කටයුතු.

| | වියදමෙහි උපරිම සීමාව | ලැබීම් වල අවම සීමාව | හර ශේෂයේ උපරිම සීමාව |
|---|---|---|---|
| විසර්ජන බලය දෙනු ලැබූ සීමාවන් | 3,500,000.00 | 1,800,000.00 | 11,000,000.00 |
| සත්‍ය අගය (2017.12.31) | 3,480,572.00 | 2,500,007.00 | 6,684,566.41 |

## වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව භෞතික හා මූල්‍ය කාර්ය සාධනය

| ක්‍රියාකාරකම | ඇස්තමේන්තු අගය | | සත්‍යඅගය (2017.12.31) | |
|---|---|---|---|---|
| | ප්‍රතිලාභීන් ගණන | වටිනාකම (රු.) | ප්‍රතිලාභීන් ගණන | වටිනාකම (රු.) |
| 1. ශිෂ්‍යාධාර ගෙවීම | 631 | 4,079,582.00 | 499 | 3,228,312.49 |
| 2. වෛද්‍යාධාර ගෙවීම | 260 | 8,503,300.00 | 192 | 8,277,549.40 |
| 3.ආගමික සිද්ධස්ථාන නඩත්තුව හා සංවර්ධනය සඳහා ගෙවීම | 412 | 25,192,340.00 | 464 | 32,499,640.07 |
| 4. පුණ්‍යාධාර ගෙවීම | 210 | 5,142,561.00 | 175 | 7,583,673.41 |
| 5. අසරණාධාර ගෙවීම | 112 | 2,090,000.00 | 382 | 2,472,390.00 |
| 6. භාර අරමුණු අනුව වෙනත් ගෙවීම් | 223 | 63,500,101.00 | 110 | 12,921,621.83 |
| 7. විහාර වන්දි නිදහස් කිරීම | - | - | 44 | 94,886,020.46 |
| 8. විදේශ වන්දි නිදහස් කිරීම | - | - | 155 | 290,099,151.26 |
| 9. භාර/බුදල් දේපල කළමණාකරනය (වතු අංශය/ශුද්ධ ලාභය) | 12 | 5,760,988.00 | 12 | 11,252,811.06 |

## භාර / බුදල් දේපල කළමණාකරණය

මහා භාරකාර තැන වෙත විවිධ බුදලයන් යටතේ වතු / කුඹුරු 12 ක් පැවරී ඇති අතර ඒවා විධිමත්ව කළමණාකරණය කර ඒවායේ ආදායම්න්ස්ථාපකගේ අරමුණු ඉටු කිරීම අපේක්ෂා කෙරේ. මෙසේ පැවරී ඇති දේපල සහ එම දේපල වලින් 2017 වර්ෂය තුළදී උපයාගන්නා ලද ශුද්ධ ලාභයන් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| **බුදලයේනම** | **වත්තේ නම** | **ශුද්ධ ලාභය/අලාභය** |
|---|---|---:|
| හැරී හපුගොඩ බුදලය | සුදුවැලිපොත වත්ත | 241,215.96 |
| | මත්තක වත්ත | 316,989.55 |
| එන්.ඩී.ඒ.සිල්වා විජේසිංහ බුදලය | රිච්මන්ඩ් පාර්ක් වත්ත | 985,694.11 |
| | රිච්මන්ඩ් කාසල් මන්දිරය | (2,040,576.59) |
| | ඉරහදයාව වත්ත | 5,487,524.00 |
| ඒ.ඒ. ද අල්විස්බුදලය | මළුවහේන වත්ත | 160,066.62 |
| ඩී.බී.ජයතිලකබුදලය | පිටකන්ද වත්ත | 1,789,429.52 |
| එන්.ඩී.එස්. සිල්වා බුදලය | වනස්ගල්ල වත්ත | 23,239.93 |
| | ලබුහේන වත්ත | (232,915.12) |
| මුහන්දිරම්ජයවික්‍රම බුදලය | ගොඩ/ මඩ ඉඩම් | 2,268,743.78 |
| මෙන්ඩිස්සිල්වා බුදලය | ගොඩ/ මඩ ඉඩම් | 978,957.30 |
| එච්.ඒ. දසිල්වා බුදලය | තෝප් වත්ත | 1,274,442.00 |
| **වතු අංශය/ සමස්ත ශුද්ධ ලාභය** | | **11,252,811.06** |

## 2017.12.31 දිනට කාර්ය මණ්ඩල සමාලෝචනය

| තනතුර | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ගය (අමාත්‍යාංශයට හෝ වෙනත් ආයතන වෙත ලිපි යොමුකර ඇත්නම්, එම ලිපිවල අංකයන් හා දිනයන්ද දක්වන්න ) | එම ක්‍රියාමාර්ගවල ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| මහා භාරකාරතැන | 01 | 01 | - | - | |
| නියෝජ්‍ය මහා භාරකාරතැන | 02 | 02 | | | |
| ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | - | - | - |
| ගණකාධිකාරී | 01 | 01 | - | - | - |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 01 | 01 | - | - | - |
| පරිපාලන නිලධාරී | 01 | - | 01 | *අධිකරණ අමාත්‍යාංශය මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අංක PT/1/3/1/111 හා 2017.11.15 දිනැතිව ලිපියොමුකර ඇත. | නිලධාරියෙකු අනුයුක්ත කර නොමැත. |
| භාෂා පරිවර්තක | 01 | - | 01 | . | - |
| සංවර්ධන නිලධාරී | 07 | 04 | 03 | *අධිකරණ අමාත්‍යාංශය මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අංක PT/1/3/1/111 හා 2017.11.15 දිනැතිව ලිපියොමුකර ඇත.. | මෙතෙක් නිලධාරීන් අනුයුක්ත කර නොමැත. |
| සංවර්ධන සහකාර | 07 | 05 | 02 | *අධිකරණ අමාත්‍යාංශය මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අංක PT/1/3/120VO iii හා 2016.10.14 දිනැතිව ලිපියොමුකර ඇත . | මෙතෙක් නිලධාරීන් අනුයුක්ත කර නොමැත. |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 28 | 23 | 05 | *අධිකරණ අමාත්‍යාංශය මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අංක PT/1/3/1/111 හා 2017.11.15 දිනැතිව ලිපියොමුකර ඇත. | මෙතෙක් නිලධාරීන් අනුයුක්ත කර නොමැත. |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන - ඛණ්ඩ 2) දෙපාර්තමේන්තු ලිපිකරු | 04 | 02 | - | නිලධාරීන්ට පෞද්ගලික වන සේ බඳවා ගෙන ඇත. කිසියම් හේතුවක් නිසා පුරප්පාඩු වූ විට තනතුර අහෝසි වේ. | - |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන - ඛණ්ඩ 2)<br>නිවාස නිලධාරී iii<br>ක්ෂේත්‍ර සම්බන්ධීකාරක iii<br>පරිගණක ලිපිකරු iii<br>පිළිගැනීමේ නිලධාරිනී iii | 15 | <br><br>01<br>01<br>12<br>01 | - | - | - |
| රියදුරු | 04 | 02 | 02 | කළ. සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/1155 හා 2017.07.04 දිනැති ලිපියෙන් බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇත. | - |
| කාර්යාල කාර්ය සහායක | 13 | 10 | 03 | කළ. සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/1155 හා 2017.07.04 දිනැති ලිපියෙන් කාර්යාල කාර්ය සහායක පුරප්පාඩු 02 ක් බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇත. | - |
| **එකතුව** | **86** | **67** | **17** | | |

## දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිරීක්ෂණ

පරිත්‍යාගශීලී ස්ථාපකවරුන් විසින් මහා භාරකාරතැන කෙරෙහි තබන ලද විශ්වාසය තහවුරු කිරීම ප්‍රධාන අරමුණ කර ගෙන මහජන සේවයෙහි නියැලෙන මහා භාරකාර දෙපාර්තමේන්තුව 2017වර්ෂය තුල දී සැලසුම් කල පරිදි සිය කාර්යභාරය නිසි ලෙස සපුරාගැනීමට සමත් වී ඇත. එම ක්‍රියාපටිපාටිය තුල විශේෂයෙන් නිරීක්ෂණය වන කරුණු කිහිපයක් පහත පරිදි සටහන් කරමි.

- 2001 සහ 2002 වර්ෂවල දී ප්‍රමුඛ බැංකුවේ ආයෝජනය කරන ලද භාර 40කට අදාල රුපියල් 129,052,032.00 ක් හා ඊට අදාල පොළී මුදල වශයෙන් රුපියල් 51,655,424.00 ක් 2017 දෙසැම්බර් මාසයේ දී ලබාගැනීමට හැකි වූ අතර එමගින් එම භාරවල දීර්ඝ කාලයක් පැවති මූල්‍ය අර්බුදයන් විසඳා ගැනීමටත් ඉදිරියේ දී නිසි පරිදි එම භාරයන් හි අරමුණු ඉටු කිරීමටත් හැකියාව ලැබී ඇත.
- 2015 වර්ෂයට පෙර දැඩි ලෙස අලාභ ලබමින් පැවති දෙපාර්තමේන්තුව සතු වතු මේ වන විට ලාභ ලබන තත්වයට පත්කර ගැනීමට හැකි වී තිබෙන අතර වතු සම්බන්ධ තාක්ෂණික දැනුමක් ඇති වතු උපදේශවරයෙකුගේ සහය දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට කටයුතු කර ඇත.
- දෙපාර්තමේන්තුව දීර්ඝ කාලයක සිට භාවිත කරනු ලබන භාර සහ බුදල් සම්බන්ධ පරිගණකගත ගිණුම්කරණ පද්ධතිය වෙනුවට වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන නව ගිණුම්කරණ මෘදුකාංගයක් ස්ථාපිත කිරීම සඳහා මේ වන විට අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇත.
- දීර්ඝ කාලයකින් යාවත්කාලීන කර නොමැති දෙපාර්තමේන්තු වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.
- 1931 සිට 1992 දක්වා වූ වසර 61 ක කාලයක් තුල මහා භාරකාරතැන වෙත තැන්පත් කල දෙපාර්තමේන්තුවෙහි සේප්පුවෙහි තැන්පත් කර තිබූ අන්තිම කැමති පත්‍ර 254 ක් විවෘත කිරීමට අධිකරණ නියෝගයක් ලබා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරන ලදී.
- ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I පන්තියේ නිලධාරියෙකු යටතේ අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කර ඇති අතර වාර්ෂික විගණන සැලැස්මක් පිළියෙළ කර ඒ අනුව අභ්‍යන්තර විගණන කාර්යයන් විධිමත් පරිදි ඉටුකරනු ලබයි. ඒ තුලින් මනා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව තුල ස්ථාපිත කර නිසි මූල්‍ය විනයකින් දෙපාර්තමේන්තු කටයුතු කරගෙන යනු ලැබේ.
- මහා භාරකාර දෙපාර්තමේන්තුව වාර්ෂිකව පවත්වනු ලබන ශ්‍රී දළදා මාළිගාවෙහි මුරුතැන් පූජාව සහ දහවල් දානය පිරිනැමීම 2017 අගෝස්තු මාසයේ දී සිදුකරන ලදී. එසේම එන්.ජේ.ඒ. කුරේ බූදලයේ භාර අරමුණු ඉටුකිරීම වශයෙන් වාර්ෂිකව රාජගිරිය වික්ටෝරියා නිවාසයට වියළි සලාක පිරිනැමීම ද 2017 ඔක්තෝම්බර් මාසයේ දී සිදුකරන ලදී. තව ද රිච්මන්ඩ් කාර්සල් මන්දිරයේ ළමා නිවාසයේ සිටින දරුවන් වෙනුවෙන් නත්තල් දින සමරු උත්සවයක් 2017 දෙසැම්බර් මාසයේ දී පවත්වන ලදී.
- භර ශේෂ මත නීතිඥ ගාස්තු ගෙවීම පිළිබඳව පැනනැගී ඇති ප්‍රශ්ණය මගහරවා ගැනීම සඳහා ද, නීතිඥ ගාස්තු ගෙවීම සඳහා මුදල් නොමැති භාරවල ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා ද අනෙකුත් භාර සහ බූදල්වලට අයත් මුදල් භාවිතා කිරීමේ තත්වය මගහරවා ගැනීම සඳහා නීතිඥ ගාස්තු ගෙවීම සඳහා අවශ්‍ය අරමුදල් මහා භාණ්ඩාගාරය වෙතින් වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හරහා ලබා ගැනීමට අවශ්‍ය මූලික පියවර ගන්නා ලදී.